# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 අගෝස්තු / සැප්තැම්බර්

### මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ දර්ශනය (නව/පැරණි නිර්දේශය)

### බෞද්ධ සමාජ දර්ශනය, පාරභෞතික ප්‍රස්තුත හා සමායාන්තර චින්තා BUPH – E 2025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. බුද්ධකාලීන භාරතීය සමාජය දේවනිර්මාණවාදී බ්‍රාහ්මණ ආධිපත්‍යය නිසා පීඩාවට පත්ව තිබූ ආකාරය මූලාශ්‍රය සාධක ඇසුරෙන් පෙන්වා දෙන්න.

02. චේතනාන්විත සාධු-අසාධු චර්යාව හැර මානව වර්ගයා වර්ගීකරණයෙහි ලා ඉවහල් වන වෙනත් සාධක නොමැති බව බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පැහැදිලි කරන්න.

03. ආර්ථික සමෘද්ධිය බෞද්ධ ගෘහස්ථ ප්‍රතිපදාවේ අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පිළිගෙන ඇති බවට ප්‍රමාණවත් මූලාශ්‍රයාගත සාධක ඉදිරිපත් කරන්න.

04. සමාජයක යහපැවැත්ම පිණිස යුතුකම් හා වගකීම් ඉටුකිරීමේ වැදගත්කම සදිසාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් විශද කරන්න.

05. රාජ්‍ය පාලනයට අදාළව පාලි සාහිත්‍ය මූලාශ්‍රයන් විසිරී පවත්නා තොරතුරු විධිමත්ව පෙළගස්වා ගැනීමෙන් දියුණු බෞද්ධ දේශපාලන දර්ශනයක් ගොඩනගාගත හැකිදැයි මූලාශ්‍රය නයින් පරීක්ෂා කරන්න.

06. සාමයික සහජීවනය පිණිස බෞද්ධ ඉගැන්වීම්වලින් ලැබෙන පිටිවහල කෙතෙක්දැයි ත්‍රිපිටකාගත සාධක ඇසුරෙන් ප්‍රමාණ කරන්න.

07. ඊශ්වර නිර්මාණවාදය පිළිබඳ කෙටි හැඳින්වීමක් කොට, එය බෞද්ධ ඉගැන්වීම්වලින් ප්‍රතික්ෂේප වන්නේ කුමන සාධක පදනම් කරගෙනදැයි පෙන්වා දෙන්න.

08. බුදුසමය දශ අව්‍යාකෘත ප්‍රශ්න ඨපනීය ලෙසින් සැලකීමේ යුක්තිය අදාළ මූලාශ්‍රය නයින් ප්‍රකට කරන්න.

09. 'ආත්මවාදය' යන්න නිර්වචනය කොට බුදුසමය 'ආත්මය' ප්‍රතික්ෂේප කරනුයේ කවර පදනමකින්දැ'යි විවරණය කරන්න.

10. පුනරුත්පත්තිය වෙනුවට පුනර්භව සංකල්පය හඳුන්වාදීමෙන් ප්‍රතීත්‍යසමුත්පන්නව සත්ත්වයාගේ සාංසාරික පැවැත්ම තහවුරු කරන අයුරු පැහැදිලි කරන්න.

*************************************